# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 55 — 1973 අප්‍රේල් 11 වැනි බදාදා — 1973.04.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය


| | පිට | | පිට |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 353 |
| ජනාධිපතිතුමාණන් කරන පත් කිරීම් ආදිය ... ... | 349 | මිල පාලන දැන්වීම් ... ... ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය ... ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත්කිරීම් ආදිය ... | 350 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශන ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 352 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්... ... ... | 358 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — | " සුරාබදු අඳපනත " පිළිබඳ දැන්වීම් ... ... | — |


සැලකිය යුතුයි.—ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 14 දරන අධිකරණ භාෂා (විශේෂ විධිවිධාන) පනත 1973 අප්‍රේල් මස 11 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ.

## ජනාධිපතිතුමාණන් විසින් කරන පත්කිරීම් ආදිය

අංකය: ඩී. 350/ආර්ඊසීවී.

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අධිකාරයට පත් කිරීම පිළිබඳ සංශෝධනයක්**

1972 ජූනි මස 2 වෙනි සිකුරාදා දින අංක 10 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1972 අංක 25 දරණ නිවේදනයට සංශෝධනය කිරීමක්:

"සෙ/96227 තාවකාලික බලලත් නිලධාරි II මාලිනෙත්තිගෙදර ස්ටැන්ලි පීරිස්—පළමුවන විමර්ශණ රෙජිමේන්තුව, ලංකා සන්නාහ සන්නද්ධ බලකාය"

වෙනුවට

"සෙ/96227 තාවකාලික බලලත් නිලධාරි II මල්වත්තේගෙදර ස්ටැන්ලි පීරිස්—පළමුවන විමර්ශණ රෙජිමේන්තුව, ලංකා සන්නාහ සන්නද්ධ බලකාය" යනුවෙන්

යොදන්න

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩී. බී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ වැඩබලන ලේකම්.

1972 සැප්තැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

4-263—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. [illegible] නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියලුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු මස 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

# වෙනත් පත් කිරීම් ආදිය

**1973 අංක 227**

ලංකා පරිපාලන සේවයේ පහත සඳහන් පත්වීම් කර ඇති බව දැනුම් දෙනු ලැබේ.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එස්. ජී. ද අල්විස් මහතා 1972. 09. 18 දින සිට 1972. 11. 28 දක්වා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටීමට.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ජී. සී. ඇටන් මහතා 1972. 09. 18 දින සිට නැවත නියමයක් කරනතුරු නිරවුල් කිරීමේ සහකාර නිලධාරියෙකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, පී. බී. පිහිල්ලේගෙදර මහතා 1971. 10. 01 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු බදුල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියාකරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ චන්ද්‍ර ගුණසේකර මහතා 1971. 10. 01 වැනි දින සිට 1972.02.15 වැනි දින දක්වා අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඩබ්ලිව්.ජේ. ඩයස් මහතා 1972. 10. 06 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු කොළඹ නියෝජ්‍ය පිස්කල් වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ජී. ලියනරත්න මහතා 1972. 10. 13 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ග්‍රාම සංවර්ධන සහකාර අධ්‍යක්ෂවරයෙකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එස්. බී. දිවාරත්න මහතා 1972. 08. 01 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඒ. එස්. ඇම්. බී. අධිකාරී මහතා 1972. 08. 01 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එස්. වික්‍රමසිංහ මහත්මිය 1972. 08. 01 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරියක වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, සී. සී. දසනායක මෙනෙවිය නැවත නියමයක් කරනතුරු 1972. 10. 07 දින සිට ගොවිජන සේවා සහකාර කොමසාරිස්වරියක වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ, ඩී. අයි. පේරගේ මහත්මිය 1972. 10. 10 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ග්‍රාම සංවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂිකා වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, කේ. ගංගාදරන් මහතා 1972. 09. 18 වැනි දින සිට සමාජ සේවා සහකාර අධ්‍යක්ෂවරයෙකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එස්. ඩබ්ලිව්. කේ. ජේ. සමරනායක මහතා 1972. 11. 01 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එච්. එච්. පී. අතුරලිය මහත්මිය 1972. 11. 01 වෙනි දින සිට නැවත නියමයක් කරනතුරු පරිවාස හා ළමාරක්ෂක සේවා සහකාර කොමසාරිස්වරියක වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එම්. එල්. ශූ. ද එස්. මලල්ගොඩ මහතා නැවත නියමයක් කරනතුරු 1972. 10. 09 වැනි දින සිට මහා භාණ්ඩාගාරයේ සැපයීම් හා සේවක සංඛ්‍යා සහකාර අධ්‍යක්ෂ වරයෙකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඩී. සී. ජයසිංහ මහතා නැවත නියමයක් කරනතුරු 1972. 09. 18 දින සිට ගොවිජන සේවා සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, අේ. වීරතුංග මහතා නැවත නියමයක් කරනතුරු 1972. 09. 18 දින සිට ගොවිජන සේවා සහකාර කොමසාරිස් වරයෙකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, කේ. ඒ. එස්. සී. කෙහෙල්වලතැන්න මහත්මිය නැවත නියමයක් කරනතුරු 1972. 10. 09 දින සිට ගොවිජන සේවා සහකාර කොමසාරිස් වරියකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එල්. එස්. ආරියරත්න මහතා නැවත නියමයක් කරනතුරු 1972. 10. 04 දින සිට ගොවිජන සේවා සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ, ඩබ්ලිව්. එම්. ටී. බී. අරබෙපොල මහතා 1972. 09. 01 දින සිට නැවත නියමයක් කරනතුරු ගොවිජන සේවා සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ, ඒ. ටී. ජේ මඩුගල්ලේ මහතා 1972.05.22 වැනි දින සිට දුම්රිය දෙපාර්තමේන්තුවේ අතිරේක සාමාන්‍යාධිකාරී (පාලන) වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එම්. සුප්‍රමනියම් මහතා 1972. 05. 22 වැනි දින සිට දුම්රිය දෙපාර්තමේන්තුවේ පාලන නිලධාරී වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එල්. බී. වේරපිටිය මහතා 1972. 09. 19 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු බදුල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියාකරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්ත වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ II වන පන්තියේ, වයි. එම්. ඩබ්ලිව්. බණ්ඩාර මහතා 1972. 10. 24 වැනි දින සිට නැවත නියමයක් කරනතුර කෑගල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියාකරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්ත වශයෙන්.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 මාර්තු මස 30 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

4-350/1—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 228**

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් ලංකා පරිපාලන සේවයේ පහත සඳහන් පත්වීම් කර ඇති බව මෙයින් දන්වනු ලැබේ :—

මාතලේ පාලන දිස්ත්‍රික්කයේ උකුවෙල කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි, ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ ටී. වීරසිංහ මහතා 1972. 09. 01 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ස්වකීය රාජකාරිවලට අතිරේකව, මාතලේ පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ (මූලස්ථාන) ප්‍රාදේශීය ආදායම් නිලධාරී, ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, චිත්‍රලතා ගුරුගේ මෙනවිය 1972. 10. 13 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ස්වකීය රාජකාරීවලට අතිරේකව, රත්නපුර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

මාතලේ පාලන දිස්ත්‍රික්කයේ (මූලස්ථාන) ප්‍රාදේශීය ආදායම් නිලධාරී, ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඩී. එම්. ජේ. දසනායක මහතා, 1972. 10. 12 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ස්වකීය රාජකාරිවලට අතිරේකව, මාතලේ පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

නුවරඑළිය පාලන දිස්ත්‍රික්කයේ (මූලස්ථාන) ප්‍රාදේශීය ආදායම් නිලධාරී, ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඩබ්ලිව්. ඇම්. ඒ. විජේකෝන් මහතා, 1972. 10. 12 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, ස්වකීය රාජකාරීවලට අතිරේකව, නුවරඑළිය පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයේ වාරියපොල කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී, ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඩබ්ලිව්. ඇම්. ඇම්. බී. වර්සකෝන් මහතා, 1972. 09. 01 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ස්වකීය රාජකාරීවලට අතිරේකව, කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය භාර

ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

මාතර පාලන දිස්ත්‍රික්කයේ (මූලස්ථාන) ප්‍රාදේශීය ආදායම් නිලධාරී, ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, කේ. ටී. විමලරත්න මහතා, 1972. 10. 16 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ස්වකීය රාජකාරීවලට අතිරේකව, මාතර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයේ ගල්ගමුව කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී, ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ආර්. එම්. කරුණාරත්න මහතා 1972. 09. 01 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ස්වකීය රාජකාරීවලට අතිරේකව, කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

කළුතර පාලන දිස්ත්‍රික්කයේ (මූලස්ථාන) ප්‍රාදේශීය ආදායම් නිලධාරී, ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ජී. අබේවර්ධන මහත්මිය 1972. 10. 12 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ස්වකීය රාජකාරීවලට අතිරේකව, කළුතර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කයේ (මූලස්ථාන) ප්‍රාදේශීය ආදායම් නිලධාරී, ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, වයි. ඒ. දයාරත්න මහතා 1972. 10. 16 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ස්වකීය රාජකාරීවලට අතිරේකව, පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියාකරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

බදුල්ල පාලන දිස්ත්‍රික්කයේ (මූලස්ථාන) ප්‍රාදේශීය ආදායම් නිලධාරී, ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ එෆ්. බී. ආර්. ද සිල්වා මහතා, 1972. 09. 19 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ස්වකීය රාජකාරීවලට අතිරේකව, බදුල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියාකරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

පුත්තලම පාලන දිස්ත්‍රික්කයේ (මූලස්ථාන) ප්‍රාදේශීය ආදායම් නිලධාරී, ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එන්. එච්. පෙරේරා මහතා 1972. 10. 13 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ස්වකීය රාජකාරීවලට අතිරේකව, පුත්තලම පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියාකරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ, ඩබ්ලිව්. බී. වැවේගම මහතා 1971. 10. 01 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු බදුල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියාකරන එකී පාලන දිස්ත්‍රික්කයේ අණ්ඩුවේ අතිරේක ඒජන්ත වශයෙන්.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 මාර්තු මස 30 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

4-350/2—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

1973 අංක 229

නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

කොළඹ 12 අළුත්කඩේ විදියේ අංක 116 හි පදිංචි නඩරාජා ජයන්තන් මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වු මාර්තු මස 23 දින,
කොළඹ දී ය.

4-301—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

අධිකරණ සේවා උපදේශක මණ්ඩලය විසින් කරන ලද ස්ථාන මාරු පත්කිරීම්

1973 මාර්තු 23 වන දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ I වන කොටසේ 1973 අංක 174 හා 1973 මාර්තු 9 වන දින දරණ නිවේදනය යටතේ 276 වන පිටුවේ පළකර ඇති එම්. එච්. බී. මොරායස් සහ ජී. එෆ්. එච්. අතුරුපාන මහතුන්ගේ ස්ථානමාරු පත්කිරීම් පහත සඳහන් ලෙස කියෙවෙන පරිදි සංශෝධනය කරමි.

එම්. එච්. බී. මොරායස් මහතා 1973 මාර්තු මස 1 වන දින සිට නැවත නියෝගයක් කරන තෙක් කොළඹ නාගරික මහෙස්ත්‍රාත් උසාවියට ස්ථානමාරු නියෝගකර කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් තඩුකාර තැන වශයෙන්.

ජී. එෆ්. එච්. අතුරුපාන මහතා 1973 මාර්තු මස 1 වන දින සිට නැවත නියෝගයක් කරන තෙක් දකුණු කොළඹ සිට මහනුවරට ස්ථානමාරු නියෝග කර මහනුවර මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, නාගරික මහෙස්ත්‍රාත් තැන සහ මහනුවර අතිරේක දිස්ත්‍රික් තඩුකාර තැන වශයෙන්.

ලයනල් සමරතුංග,
අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ ලේකම්.

1973 අප්‍රේල් මස 4 වැනි දින,
සී. 52, කැප්පෙටිපොල පාර,
අධිකරණ සේවා උපදේශක සහ විනය මණ්ඩල කාර්යාලය,
කොළඹ 5 දී ය.

4-360—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

# ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඞී.—ඞී. 7/63.

1963 අංක 4 දරණ දේශීය ආදායම් පනත

16අ වගන්තිය යටතේ දැන්වීම

1969 අංක 6 දරණ පනතින් සංශෝධිත 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනතේ 16අ වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බල තල ප්‍රකාර, වැඩබලන මුදල් ඇමති බර්නාඩ් සොයිසා වන මම, "ලාදුරු රෝගී පුනරුත්ථාපන හා අභිවෘද්ධි සමිතිය", එකී වගන්තියේ කාර්යයන් සඳහා පිළිගත් පුණ්‍යායතනයක් යයි මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

බර්නාඩ් සොයිසා,
වැඩ බලන මුදල් ඇමති.

1973 මාර්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

4-380/1—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

එල්. ඩී.—බී. 7/63.

**1963 අංක 4 දරන දේශීය ආදායම් පනත**

16අ වගන්තිය යටතේ දැන්වීම

1969 අංක 6 දරන පනතින් සංශෝධිත, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16අ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වැඩබලන මුදල් ඇමති බර්නාඩ් සොයිසා වන මම, "කොළඹ අගරද ගුරු පදවියේ නව ආසන දෙව්මැදුර සඳහා ගොඩනැගිලි අරමුදල" එකී වගන්තියේ කාර්යයක් සඳහා පිළිගත් පුණ්‍යායතන යක් යයි මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

බර්නාඩ් සොයිසා,
වැඩ බලන මුදල් ඇමති.

1973 මාර්තු මස 31 වැනි දින,
කොළඹ 1.

4-380/2—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

එල්. ඩී.—බී. 18/71.

**1971 අංක 13 දරන රජයේ මැණික් නීතිගත සංස්ථා පනත**

1971 අංක 13 දරන රජයේ මැණික් නීතිගත සංස්ථා පනතේ 21 (1) වැනි වගන්තිය යටතේ රජයේ මැණික් නීතිගත සංස්ථාව විසින් මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ඇතිව සාදනු ලැබූ අතුරු ව්‍යවස්ථා.

සී. ඒ. කුරේ,
මුදල් අමාත්‍යාංශයේ ලේකම්.

1973 මාර්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

අතුරු ව්‍යවස්ථා

රජයේ මැණික් නීතිගත සංස්ථාව විසින් සාදන ලදුව, 1971 දෙසැම්බර් මස 23 වැනි දින අංක 14,989/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1971 අංක 1 දරන රජයේ මැණික් නීතිගත සංස්ථා අතුරු ව්‍යවස්ථා පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

එකී අටවන උපලේඛනයේ "ප්‍රකාශය" යන ශීර්ෂය යටතේ ඇති "අවලංගු කරනු ලැබිය හැකි බවටත්, මා විසින් තැන්පත් කරන ලද සියලුම මුදල් රාජසන්තක කරනු ලැබිය හැකි බවටත්" යන වචන වෙනුවට "අවලංගු කරනු ලැබිය හැකි බවට" යන වචන ආදේශ කිරීමෙන්.

4-261/1—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

එල්. ඩී.—බී. 18/71.

**1971 අංක 13 දරන රජයේ මැණික් නීතිගත සංස්ථා පනත**

1971 අංක 13 දරන රජයේ මැණික් නීතිගත සංස්ථා පනතේ 21 (1) වන වගන්තිය යටතේ, රජයේ මැණික් නීතිගත සංස්ථාව විසින් මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සාදන ලද අතුරු ව්‍යවස්ථාව.

සී. ඒ. කුරේ,
මුදල් අමාත්‍යාංශයේ ලේකම්.

1973 මාර්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

අතුරු ව්‍යවස්ථාව

1971 දෙසැම්බර් මස 23 වැනි දින අංක 14,989/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1971 අංක 1 දරන ලංකා රාජ්‍ය මැණික් නීතිගත සංස්ථා අතුරු ව්‍යවස්ථා, එහි හතරවැනි උපලේඛනයේ "බලපත්‍රය පිළිබඳ කොන්දේසි" යන ශීර්ෂය යටතේ 1 වන කොන්දේසියෙහි "රු. 25 ක" යන යෙදුම ඉවත් කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4-261/2—73.04.11 දින අංක 55 දරණ ගැට පත්‍රය

---

**1972 අංක 5 දරන සමුපකාර සමිති පනත**

බලතල පැවරීම

**නියෝගය**

1972 අංක 5 දරණ සමුපකාර සමිති පනතේ 2(4) වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, විදේශීය හා දේශීය වෙළඳ ඇමති, ටිකිරි බණ්ඩාර ඉලංගරත්න වන මම සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමාට සහාය වීමට පත්කර ඇත්තාවූ මීට අමුණා ඇති උපලේඛනයේ I වෙනි තීරුවෙහි සඳහන් එක් එක් අය වෙත 1972 අංක 5 දරණ සමුපකාර සමිති පනත හා ඒ යටතේ පනවා ඇති නියෝග මාලාව යටතේ රෙජිස්ත්‍රාර්තුමා වෙත පැවරී ඇත්තාවූ එකී උපලේඛනයේ II වෙනි තීරුවෙහි සඳහන් සියළුම බලතල මෙයින් පවරමි.

ටී. බී. ඉලංගරත්න,
විදේශීය හා දේශීය වෙළඳ ඇමති..

1973 මාර්තු මස 26 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

| I වෙනි තීරුව | II වෙනි තීරුව |
|---|---|
| 1. විශ්වලිංගම් මහේන්ද්‍රන් මහතා<br>2. හියු ඉකිරිවත්ත මහතා<br>3. පද්මාවතී ධර්මතිලක ජය වීර මහත්මිය<br>4. සුගතපාල පිටිගල ලියනගේ මහතා<br>5. අළුත් පටබැඳිගේ ඩයිනිස් මහතා<br>6. ආනන්ද හේරත් මහතා<br>7. වත්ති උන්නැහෙලාගේ හේරත් මහතා<br>8. මුදියන්සේ ඇටම්පාවල මහතා | සමුපකාර සමිති පනතේ 3, (3 (1) (ඇ) හැර) 5, 6, 7, 8, 33, 39, 42(1), 43, 44, (44(6) හැර) 45, 46, 47, 50, 52, 53, 54, 58, (58 (2) (අ) හා 58 (5) හැර) 59, 68 සහ 72 යන වගන්ති යටතේ රෙජිස්ත්‍රාර්ගේ සියළුම බලතල.<br>ව්‍යවස්ථා යටතේ 3, 13, 14(2), 15 (4) 23, 24, 27, 28, 29, 31, 32, 33ඒ, 37, 38, 42, 43, සහ 45 දරණ ව්‍යවස්ථා යටතේ රෙජිස්ත්‍රාර්ගේ සියළුම බලතල. |
| 9. සේනානායක උපසේන මහතා<br>10. වීරවර්ධන පතිරන්නැහෙලාගේ දොන් පාලිත වීරවර්ධන මහතා<br>11. සුනිල් චන්ද්‍ර මාත්තප්පෙරුම මහතා<br>12. මුහන්දිරම් මුදියන්සේලාගේ ස්වර්ණලතා මැණිකේ මහත්මිය<br>13. ගිනිගේ කමලනී චන්ද්‍රානිද සිල්වා මහත්මිය<br>14. වික්‍රමසිංහ පතිරණගේ සිරිසේන ජයවර්ධන මහතා<br>15. අල්ගම කෝරාළලාගේ ස්ටීවන් පෙරේරා මහතා<br>16. දොඹවලගේ විලියම් ප්‍රනාන්දු මහතා<br>17. රාජකරුණා මුදියන්සේලාගේ චන්ද්‍රපාලි ගුණරත්න උඩුගම්පොල මහත්මිය<br>18. ස්වර්ණපාලි වික්‍රමසිංහ මහත්මිය<br>19. විමලසේන මත්තක ගමගේ මහතා<br>20. ජයරත්න ජයසිංහ මහතා<br>21. අදිකාරි මුදියන්සෙලාගේ සේකර බණ්ඩා අදිකාරි මහතා<br>22. සෙනෙවිරත්න බණ්ඩාර දිවාරත්න මහතා<br>23. මාබොටුවන ජාගොඩගේ චන්ද්‍රදාස මහතා<br>24. කන්දයියා ෂන්මුගලිංගම් මහතා | |

| I වෙනි තීරුව | II වෙනි තීරුව |
|---|---|
| 25. බෝතලගේ මැතියස් ප්‍රනාන්දු මහතා | |
| 26. ධර්මසේන බණ්ඩා මාමඩුව මහතා | |
| 27. වර්ණකුලසූරිය තෝමස් ලොව් මහතා | |
| 28. පිලිප් එල්රඩ් ඩන්ස්ටන් හිපොලිට් ප්‍රනාන්දු මහතා | |
| 29. විජයරත්නම් තුරෙසිරත්නම් මහතා | |
| 30. සිරිමාන්න වල්ගම මහතා | |
| 31. ජෝසප් රෝලන්ඩ් ඩි ලිවේරා කරුණාරත්න මහතා | |
| 32. ප්‍රේම රන්ජන් තිලකරත්න මහතා | |
| 33. ෂන්මුගම් ඥානප්‍රකාසම් මහතා | |
| 34. සින්නතම්බි නිතියානන්දන් මහතා | |
| 35. කිත්තන්ගොඩ සිරිල් ජය රත්න මහතා | |
| 36. තම්බයියා කන්දසාමි මහතා | |
| 37. ගුස්තිඥ වඩු කුලතිලක ද සිල්වා මහතා | |
| 38. සිරිදාස ද සොයිසා මුණසිංහ මහතා | |
| 39. දෙන් ලයනල් බීඩ් ජෝසප් අබේරත්න මහතා | |
| 40. චාල්ස් නෙවිල් උදලාගම | |
| 41. ඉලංගන්පේලි ගෙදර ජේම්ස් ඉලංගසේකර මහතා | |
| 42. ත්‍යාගරාජා ෂන්මුගරාජා මහතා | |
| 43. සින්නතුරෙයි නාගලිංගම් මහතා | |
| 44. බෝදර ගමගේ රිචඩ් පෙරේරා මහතා | |
| 45. රාජපක්ෂ දොන් පියදාස ජයසේකර මහතා | |
| 46. වන්නක්කු වත්ත වඩුගේ ජෝන් රෙජිනෝල්ඩ් ඇලෝසියල් ප්‍රනාන්දු මහතා | |
| 47. රොබට් වින්ස්ටන් සමර සේකර කරුණාරත්න මහතා | |
| 48. ගුණතිලක බණ්ඩා පෙරමුණේ මහතා | |
| 49. මාවතගේ වියුරින් පෙරේරා සෙනෙවිරත්න මහත්මිය | |
| 50. සුදුම මුදියන්සේලාගේ රන් බණ්ඩා මහතා | |
| 51. කන්දයියා ගුණරත්නම් මහතා | |
| 52. විජයරත්නම් සුන්ද්‍ර රාම් නාදර් මහතා | |
| 53. තන්තිරි මුදලිගේ දොන් ප්‍රැන්සිස් රොබට් මහතා | |
| 54. කන්දයියා රාමදාසන් මහතා | |
| 55. ජෝන් පිල්ලෙයි එඩ්වර්ඩ් සෞන්දරාජා මහතා | |
| 56. පුංචි නිලමේ කරුණාරත්න මහතා | |
| 57. ප්‍රැන්සිස් සමරසිංහ මහතා | |
| 58. දොන් කුලතුංග සමරවීර මහතා | |

4-302—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී. 35/49.

විදුලි සංදේශ ආඥපනත

(192 වැනි අධිකාරය වන) විදුලි සංදේශ ආඥපනතේ 13 වැනි වගන්තිය යටතේ තැපැල් සහ විදුලි සංදේශ අමාත්‍යවරයා විසින් සාදන ලද රීති.

සී. කුමාරසූරියර්,
තැපැල් සහ විදුලි සංදේශ අමාත්‍ය.

1973 මාර්තු 31 වැනි දින,
කොළඹ දීය.

ඉන්දු-ශ්‍රී ලංකා දුරකථන රීති

1. මෙම රීති ඉන්දු-ශ්‍රී ලංකා දුරකථන රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (i) ඉන්දු-ශ්‍රී ලංකා දුරකථන ඇමතීමක ප්‍රථම සංවාද කාල පරිච්ඡෙද ඒකකය අයකළ හැකි කාලයේ විනාඩි තුනක් ද දෙවැනි සහ ඊට පසුව එන එක් එක් ඒකකය අය කළ හැකි කාලයේ විනාඩි එකක් ද වන අතර තත්පර පහකට වැඩිවූද තත්පර හැටකට අඩුවූද අය කළ හැකි කාලයේ යම් කාල ප්‍රමාණයක් මේ කාර්යය සඳහා විනාඩි එකක් හැටියට සලකනු ලැබිය යුතුය.

(ii) යම් එක් ඇමතීමක් සඳහා උපරිම කාල සීමා නියමයක් නොතිබිය යුතුය ; එසේ වුවද, ඇමතීම් අධිකවූ අවස්ථාවකදී, ප්‍රථම කාල පරිච්ඡෙද ඒකකය වූ විනාඩි තුනට ඇමතීම සීමා කරනු ලැබිය හැකිය.

(iii) බාහිර මාර්ගය හෝ එහි යම් කොටසක් ප්‍රයෝජනයට ගැනීමට බලාපොරොත්තුව සිටින වෙනත් යම් අමතන්නකුට බාධාවන පරිදි, එක් වරකදී ඇමතීම් එකකට වැඩි ගණනක් සඳහා බාහිර මාර්ගය යොදවා ගැනීමට කිසිම අමතන්නකුට හිමිකම් නොතිබිය යුතුය.

(iv) ඇමතීම් කාලය සීමා කරනු ලැබූ විට, අමතන්නාට ඒ බව දනුම් දිය යුතු අතර හැකිනම් ඇමතුම් සම්බන්ධය දෙන්නට ආසන්න අවස්ථාවේදී එසේ කල යුතු වන්නේය ; තවද අමතන්නාට සහ ඇමතුම ලබන තැනැත්තාටද ඇමතුම විසන්ධි කිරීමට තත්පර කීපයකට කලින් හැකි නම් ඒ ගැන මතක් කළ යුතුය.

3. (i) පහත සඳහන් ක්‍රම දෙකින් එක් ක්‍රමයකට ඉන්දු-ශ්‍රී ලංකා ඇමතීමක් වෙන් කරවා ගත හැකිය :—

(අ) සාමාන්‍ය ඇමතීමක් ලෙස—එනම් අමතන සහ අමතනු ලබන අංක ද සටහන් කොට එක් නිශ්චිත අංකයක සිට තවත් නිශ්චිත අංකයකට පමණක් කරන ඇමතීමක්, හෝ

(ආ) පෞද්ගලික ඇමතීමක් ලෙස—එනම් ඇමතුම් අංකයේ සිටින නිශ්චිත තැනැත්තකුගෙන් අමතනු ලබන අංකයේ සිටින නිශ්චිත තැනැත්තකුට දෙන ඇමතීමක්.

(ii) පෞද්ගලික ඇමතීමක් වෙන් කරවා ගන්නා අමතන්නකුට කැමති නම් විකල්ප පිළිවෙලක් වශයෙන්, තමන් සඳහා ආදේශකයකු ද, නිශ්චිත තැනැත්තා සඳහා අමතනු ලබන අංකයේ හෝ වෙනත් යම් අංකයක සිටින ආදේශකයකු ද නම් කළ හැකිය. නම් කරන ලද තැනැත්තන්ගෙන් කිසිවෙක් දෙන ලද යම් අංකයකදී ඇමතුම ලබාගතහොත් ඇමතීම සාර්ථක වූ ලෙස සැලකිය යුතුය.

(iii) සාමාන්‍ය ඇමතීමක් සම්බන්ධයෙන්, අමතන අංකය අමතනු ලබන අංකය සමග සම්බන්ධය සලසනු ලැබූ මොහොතේ සිටද, පෞද්ගලික ඇමතීමක් සම්බන්ධයෙන් අමතන්නාට නැත්නම් ඔහු වෙනුවට නම් කරනු ලැබ ඇති ඔහුගේ ආදේශකයාට අමතනු ලබන්නා සමග හෝ ඔහුගේ ආදේශකයා සමග හෝ සම්බන්ධය සැලසූ මොහොතේ සිටද සංවාදය පිළිබඳ ප්‍රථම කාල පරිච්ඡෙද ඒකකය ආරම්භවූ ලෙස සැලකිය යුතුය.

(iv) වෙන් කරවා ගෙන ඇති ඇමතීම් ඒවා සම්බන්ධ කර නොමැති, අමතනු ලබන තැනැත්තා විසින් ප්‍රතික්ෂේප කර නොමැති හෝ අමතන්නා විසින් අවලංගු කර නොමැති තාක් කල් වළංගුව පැවතිය යුතුය.

4. (i) පෞද්ගලික ඇමතීමක් සම්බන්ධයෙන්—

(අ) සීනු සංඥව දෙනු ලැබීමෙන් පසුව අමතනු ලැබූ අංකය හෝ නිශ්චිත තැනැත්තා බාහිර සම්බන්ධයක් ප්‍රතික්ෂේප කළහොත් විනාඩි තුනක සාමාන්‍ය ඇමතීමක් සඳහා නියමිත ගාස්තුව අමතන්නාගෙන් අය කළ යුතුය.

(ආ) අමතනු ලැබූ අංකය සමග සම්බන්ධය සලසනු ලැබීමෙන් පසුව සහ අමතනු ලබන තැනැත්තා හෝ එම තැනැත්තා සඳහා වූ ආදේශකයා හෝ කථා කිරීමට ඉදිරිපත් නොවන බව අමතන්නාට හෝ එසේ නොහැකි නම් ඔහුගේ ටැලිපෝනය වෙත සිටින යමකුට හෝ දන්වනු ලැබීමෙන් පසුව ඇමතීම අතහැර දමනු ලැබුවහොත් වාර්තා කිරීමේ ගාස්තුවක් අය කළ යුතුය.

(ඇ) ඇමතීමක් අමතනු ලබන අංකය සමග ක්‍රියාත්මක වීමට සූදානම් වූ කල්හි, අමතන්නා හෝ අමතනු ලබන්නා හෝ නොසිටීමෙන් නැතහොත් කථා කිරීමට අකමැති වීමෙන් නැතහොත් අමතන්නාගේ හෝ අමතනු ලබන්නාගේ හෝ ටැලිපෝනයෙන් උත්තරයක් නැතිවීමෙන් ඇමතීම අවලංගු කරනු ලැබුවහොත් ; හෝ

**1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රජයේ වාණිජ නීතිගත සංස්ථා පනත**

**නිවේදනයයි**

1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රජයේ වාණිජ නීතිගත සංස්ථා පනතේ 10 වැනි වගන්තිය යටතේ, වැවිලි කර්මාන්ත ඇමතිතුමා විසින්, කැරිල් ප්‍රඩිකන්ස් මහතා ශ්‍රී ලංකා රජයේ තේ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙක් වශයෙන් 1973 මාර්තු මස 26 වැනි දින සිට 1975 පෙබරවාරි මස 17 වැනි දින දක්වා පත්කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩොරික් ද සූසා,
ලේකම්,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.

1973 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ 1.

4–344—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

**පඩිපාලක සභා ආඥාපනත**

**නිවේදනයයි**

1973 මර්තු මස 25 වැනි දින සිට අවුරුදු තුනක කාලයක් තුළ හෝසියරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයන් වශයෙන් පෙනී සිටීමට (136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ කම්කරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත්කරන ලද බව 1971 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 30 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්.

1973 මාර්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

**නම නියම කොට පත්කරන සාමාජිකවරු :**

1. මහාචාර්ය ඒ. ඩී. වී. ද එස්. ඉන්ද්‍රරත්න මහතා
2. බී. ජේ. මුණසිංහ මහතා
3. එම්. එන්. ජයන්ත ජයරත්න මහතා

**සේව්‍ය නියෝජිත සාමාජිකවරු :**

1. ලොයිඩ් ද මැල් මහතා
2. ඇස්. ඒ. සී. මූසින් මහතා
3. ජී. ඇස්. අප්පදොරෙයි මහතා
4. කේ. විජයරත්නම් මහතා
5. ඩී. ඊ. මැන්ඩිස් මහතා
6. ඇස්. පී. බැලසූරිය මහතා
7. වී. ඇස්. ඇම්. ද මැල් මහතා
8. බර්නාඩ් ඒ. බෙතේජු මහතා
9. එඩ්වර්ඩ් ද එස්. සිල්වා මහතා
10. ඒ. ආර්. බින් ආද්හම් මහතා

**සේවක නියෝජිත සාමාජිකවරු :**

1. සාම විනිසුරු ඇම්. ඇම්. සෙනෙවිරත්න මහතා
2. සුනිල් කඩියාව මහතා
3. අධිනීතිඥ අනිල් ඔබේසේකර මහතා
4. තන්දසිරි ගුණරත්න මහතා
5. ඩබ්ලිව්. ඇල්. ප්‍රනාන්දු මහතා
6. ජෝල් සිඩ්නි ප්‍රනාන්දු මෙනෙවිය
7. ඇම්. සී. ඇම්. හනීෆ් මහතා
8. ඇම්. ස්ටීවන් ද කෝස්තා මහතා
9. ඔස්වින් ප්‍රනාන්දු මහතා
10. එල්. ටී. ප්‍රනාන්දු මහතා.

4–280—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

**පඩි පාලක සභා ආඥාපනත**

**නිවේදනයයි**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් ඒ උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට, එම පඩිපාලක සභාව අදහස් කරන බව යට කී ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒ සභාව විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහතකී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරුද්ධතා 1973 අප්‍රියෙල් මස 26 වැනි දින දවල් 12 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන ඒ සෑම විරුද්ධතාවක්ම එසේ විරුද්ධ වීමට හේතුවූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් විය යුතුය.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සභාපති.

1973 අප්‍රේල් මස 6 වැනි දින,
කොළඹ දීය.

**උපලේඛනය**

ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් කරන ලදුව 1945 අගෝස්තු මස 10 වැනි දින අංක 9,447 දරණ විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනයෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, 1970 අගෝස්තු මස 28 වැනි දින අංක 14,920/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් අවසාන වරට වෙනස් කරන ලද්දාවූ ද තීරණ, එකී උපලේඛනයේ "ආණ්ඩුවේ නිවාඩු දවස් (25 වැනි වගන්තිය)" යන ශීර්ෂය යටතේ වූ 8 වැනි ඡේදයේ (අ) අනුච්ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් අනුච්ඡේදය ආදේශ කිරීමෙන් තවදුරටත් මෙසේ කළ යුතුය :—

"ආණ්ඩුවේ නිවාඩු දවස් (25 වැනි වගන්තිය)"

8. (අ) මේ ඡේදයෙහි හා 2 වන ඡේදයෙහි විධිවිධානවලට යටත්ව, සෑම සේවා යෝජකයකුම විසින්, තමා විසින් සේවයෙහි යොදවනු ලැබ සිටින සෑම කම්කරුවකුටම 1971 අංක 29 දරණ නිවාඩු පනතෙහි අර්ථානුකූල වූ පහත දක්වෙන එක් එක් ආණ්ඩුවේ නිවාඩු දිනය, පාරිශ්‍රමිකය සහිත නිවාඩු දිනයක් වශයෙන් දිය යුතුය :—

1. දෙමළ තෛපොන්ගල් දිනය;
2. සිංහල සහ දෙමළ අළුත් අවුරුදු දිනයට පෙරාතු දිනය;
3. සිංහල සහ දෙමළ අළුත් අවුරුදු දිනය;
4. මිලාද්-උන්-නබි (මොහමඩ් නබිනායක තුමාණන් වහන්සේ උපන් දිනය);
5. මැයි දිනය (මැයි 1);
6. සිංහල වෙසක් මස පුන් පොහෝ දිනයට ඉක්බිතිවම එළඹෙන දිනය;
7. ජනරජ දිනය (මැයි 22);
8. බණ්ඩාරනායක අනුස්මරණ දිනය (සැප්තැම්බර් 26);
9. නත්තල් දිනය.

4–423—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

අංක : ඊ. 23/කො. 456/72.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් පනත (විශේෂ විධිවිධාන) සමග කියැවෙන) දරන (සංශෝධිත) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 1972 දෙසැම්බර් මස 8 වන දින අංක 37 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1972 නොවැම්බර් මස 24 වන දින දරන නියෝගයෙන් එච්. ඩී. ඇල්පේනිස් මහතා, 110, වේරහැර බොරලැස්ගමුව සහ ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය, පිඟන් කම්හල, පිළියන්දල, අතර ඇති 1972 නොවැම්බර් මස 21 දින දරන ආරවුල පිළිබඳව කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරණය පිළිබඳ වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථය කිරීම සඳහා කොළඹ 3, අබ්දුල් කෆූර් මාවතේ අංක 26 හි එම්. රාජනායගම් මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතුයැයි දැන් පෙනීයන හෙයින්, කම්කරු ඇමති වන මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, එකී නියෝගය අවලංගු කරන අතර, එකී 1972 නොවැම්බර් මස 24 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 මාර්තු මස 27 වන දින,
කොළඹ දීය.

4–381/1—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

අංක : ඊ. 23/කො. 456/72.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිතකර දක්වා ඇති කාරණය පිළිබඳව එච්. ඩී. ඇල්පේනිස් මහතා, 110, වේරහැර බොරලැස්ගමුව සහ ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය, පිඟන් කම්හල, පිළියන්දල. අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, නුගේගොඩ, පාගොඩ පාරේ අංක 18 හි පදිංචි ජේ. ජී. ඇල්. ස්වාරිස් මහතා වෙත මෙයින් යොමුකරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 මාර්තු මස 27 වන දින,
කොළඹ දී ය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

එච්. ඩී. ඇල්පේනිස් මහතා, 110, වේරහැර, බොරලැස්ගමුව

**සහ**

ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය, පිඟන් කම්හල, පිළියන්දල

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණ නම් ඇල්පේනිස් මහතා වැඩකරන සාමාන්‍ය පැය ගණනට (එනම් දිනකට පැය අටයි) වැඩියෙන් කරන ලද වැඩ සඳහා අතිකාල වේතන නොගෙවීම යුක්ති සහගතද යන්නත් ඔහුට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

1973 මාර්තු මස 20 වනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

4–281/2—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සමාගම් ආඥාපනත (145 වැනි අධිකාරය)**

277 (3) වගන්තිය යටතේ සීමාසහිත කිතගේන එස්වෙව් ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් ආඥාපනතේ (145 වැනි අධිකාරය) විධිවිධානය යටතේ 1972 ජනවාරි මස 25 වැනි දින සංස්ථාපිත සමාගමක් වන සීමාසහිත කිතගේන එස්වෙව් ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, සීමාසහිත කිතගේන එස්වෙව් ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් තැන්පත් රුවන්පුර ලික්මන් ද සිල්වා වන මම, සමාගම් ආඥාපනතේ (145 අධිකාරය) 277 (3). වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ආර්. එල්. ද සිල්වා,
සමාගම් රෙජිස්ට්‍රාර්.

1973 මාර්තු මස 29 වැනි දින,
කොළඹ, සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ දී ය.

–424—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

**වන්දනා ආඥාපනත**

ගොඩපිටිය මුස්ලිම් උත්සවය—1973

මාතර දිස්ත්‍රික්කයේ ගොඩපිටියේ පෝරුවේ (ගොඩපිටිය) මුහුදීන් මුස්ලිම් දේවස්ථානයේ වාර්ෂික ආගමික උත්සවය 1973 මැයි මස 10 වැනි දින ආරම්භකර 1973 මැයි මස 20 වැනි දින අවසන් කරන බව (175) අධිකාරියේ වන්දනා ආඥාපනත යටතේ සකස්කොට 1954 ජනවාරි මස 8 වැනි දින ප්‍රසිද්ධ කරන ලද අංක 10,630 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද රෙගුලාසිවල 3 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

1954 ජනවාරි මස 8 වැනි දින ප්‍රසිද්ධ කරන ලද අංක 10,630 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකරන ලද රෙගුලාසි, ඉහත දැක්වෙන කාලය තුළ දී එකී රෙගුලාසිවල සඳහන් එහිම උපලේඛයෙහි විස්තරවන "කඳවුරු තුළ" ක්‍රියාත්මක වේ.

ජී. ඒ. එම්. කරුණාරත්න,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1973 මාර්තු මස 30 වැනි දින,
මාතර දිසාපති කාර්යාලයේ දී ය.

4–293—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

ණය අංක 3290.

**ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව**

(402 අධිකාරය වන) කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථා ආඥාපනතේ 71 වන වගන්තිය යටතේ යෝජනාව

1972 අප්‍රේල් 28 වෙනි දින පහත සඳහන් යෝජනාව ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකමතිකව සම්මත කරගත් බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

"ප්‍රසිද්ධ නොතාරිස්, ජේ. ඇල්. පී. පෙරේරා විසින් ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව නමට ලියා සහතික කරන ලද අංක 5139 හා 66.12.22 දින දරණ බැඳුම්කරයෙහි සඳහන් ගෙවීම් ගම්පොල, ඩාර්ට්‍රි වතුයායේ පදිංචි අලගප්පන් අලගේසප්පන් වෙල්ලසාමි යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය යටතේ රුපියල් තිස්දෙදාස් හැත්තෑහතරයි සත හැට එකක (රු. 32,074.61) මුදලක් එකී සංස්ථාවට දැනට අයවිය යුතු හෙන් ද, එකී අංක 5139 දරණ බැඳුම්කරය යටතේ එකී සංස්ථාවට උකස් කර ඇත්තාවූ මහනුවර දිස්ත්‍රික්කයේ, අත්ගම්මන සහ කොබ්බෑවෙල පිහිටි බලයලත් මිනින්දෝරු, ඇම්. ඇල්. තීර්තමේලු විසින් සකස් කරන ලද අංක 51 සහ 55.2.18 වෙනි දින දරණ ප්ලෑන ප්‍රකාර අ. 41, රූ. 0, ප. 12ක ප්‍රමාණයෙන් යුත් නිව් අත්ගම්මන එස්ටේට් (කොටස) නමැති දේපල එකී ඉඩමට පිවිසීම සඳහා නිව් අත්ගම්මන වත්ත මැදින් වැටී ඇති එකී අංක 51 දරන ප්ලෑනේ සඳහන් පාරෙන් ඇතුළුවීමේ සහ පිටවීමේ සම්පූර්ණ අයිතිය, නිදහස සහ බලයද සහිතව, මහනුවර පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ලොයිඩ් සමරවික්‍රම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමටත්, එසේ විකුණා එකී මුදල් හෝ එසේ විකුණන අවස්ථාවේදී එයින් ආපසු නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් සහ එවකට අයවිය යුතුව ඇති පොලියත්, එකී ආඥාපනතේ 78 වන වගන්තියේ විධිවිධාන යටතේ ප්‍රචාරක, විකුණුම් හා වෙනත් ගාස්තුත් සමග අයකර ගැනීමටත් කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි."

එච්. ඇස්. ඇප්. ගුණවර්ධන,
සාමාන්‍යාධිකාරී.

1973 මාර්තු 27,
කොළඹ 3.

4-382—73.04 11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

ණය අංක 2825.

**ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව**

(402 අධිකාරය වන) කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථා ආඥාපනතේ 71 වන වගන්තිය යටතේ යෝජනාව

1972 දෙසැම්බර් 15 වෙනි දින සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගත් බව මෙයින් නිවේදනය කරනු ලැබේ:—

"ප්‍රසිද්ධ නොතාරිස්, ඇන්. සම්බන්දන් විසින් ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව නමට ලියා සහතික කරන ලද අංක 1943 හා 64.4.10 වෙනි දින දරණ බැඳුම්කරයෙහි සඳහන් ගෙවීම් කොළඹ, දෙවෙනි හරස් පාරේ 21 දරණ ස්ථානයෙහි පදිංචි අබ්දුල් රහමාන් මහබූබ් නමැති අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය යටතේ රුපියල් හැටපන්දාස් එකසිය තිස්අටයි සත පහක (රු. 65,138.05) මුදලක් එකී සංස්ථාවට දැනට අයවිය යුතු හෙයින් ද, එකී අංක 1043 දරණ බැඳුම්කරය යටතේ එකී සංස්ථාවට උකස් කර ඇත්තාවූ මහනුවර දිස්ත්‍රික්කයේ, ගම්පොල අසල බදව සහ හෙරකොල ගම්වල පිහිටි, අ. 219, රූ. 1, පර්. 15 ක ප්‍රමාණයෙන් යුත් බලයලත් මිනින්දෝරු, ජේ. සී. ඇස්. මිසෝ විසින් සකස් කරන ලද අංක 1087පී සහ 40.6.15 දින දරණ ප්ලෑනේ ලොට් 3 වශයෙන් දක්වා ඇති ලැන්ටර්න් හිල් වත්ත සහ එහි පිහිටි සියළු දේද (2) ඉහතකී ගම්පොල අසල දොලොස්බාගේ බඩව සහ හෙරකොල ගමේ පිහිටි එකී අංක 1087පී දරණ ප්ලෑනේ ලොට් 3ඒ දරණ ලැන්ටර්න් හිල් වත්ත සහ එහි පිහිටි සියළු දේද නමැති දේපල, මහනුවර පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ලොයිඩ් සමරවික්‍රම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමටත්, එසේ විකුණා එකී මුදල් හෝ එසේ විකුණන අවස්ථාවේදී එයින් ආපසු නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් සහ එවකට අයවිය යුතුව ඇති පොලියත්, එකී ආඥාපනතේ 78 වන වගන්තියේ විධිවිධාන යටතේ ප්‍රචාරක, විකුණුම් හා වෙනත් ගාස්තුත් සමග අයකර ගැනීමටත් කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි."

එච්. ඇස්. ඇප්. ගුණවර්ධන,
සාමාන්‍යාධිකාරී.

1973 මාර්තු 28,
කොළඹ 3.

4-381—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

**ගමනාගමනයට බාධා**

**කොට්ඨාශය—බටහිර** **ප්‍රාදේශීය කාර්යාලය—අත්තනගල්ල**

වේයන්ගොඩ-රුවන්වැල්ල මාර්ගයේ අංක 7/3 දරණ පාලම අළුත්වැඩියා කිරීම සඳහා අප්‍රේල් මස 19 වන දින සිට ජූනි මස 4 වෙනි දින දක්වා සියළුම රථවාහන සඳහා වසා තබන බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

මේ වෙනුවට විකල්ප මාර්ගය වනුයේ වල්පොල-වල්ගම්මුල හරහා ඌරාපොල පාර—දුර ප්‍රමාණය සැතපුම් පහමාරකි (5 1/2).

එන්. පී. ඒ. විජේසේකර,
බටහිර දිසා වැඩ අධ්‍යක්ෂ.

ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සේවා සංවිධානය,
බටහිර දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
කොළඹ 7. 1973 අප්‍රේල් මස 11 වෙනි දින.

4-274—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

**මහ/සෙංකඩගල අද බිහිරි පාසැලේ සාමාන්‍යාධිකාරී තනතුර වෙනස්වීම**

මහනුවර, දොඩම්වල, සීමාසහිත සෙංකඩගල අඳ ගොළු බිහිරි පාසැල් සමිතියේ නිර්දේශය පරිදි යථෝක්ත පාසැලෙහි සාමාන්‍යාධිකාරී තැන වශයෙන්, ගල්එදන්ඩේ මුදියාන්සේලාගේ තින්බණ්ඩා ඒකනායක මහතා 1972 දෙසැම්බර් මස 11 වැනි දින සිට පත්කරන්නට යෙදුණු බව, ආධාර ලබන ඉංග්‍රීසි පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ 26(5) වගන්තිය යටතේ සියළුදෙනාගේම දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. ජයසූරිය,
මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1973 අප්‍රේල් මස 3 වෙනි දින,
මහනුවර, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

4-361—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

අංක 440

**1970 අංක 35 දරණ සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත**

2(1) වැනි වගන්තිය යටතේ ආඥාව

1970 අංක 35 දරණ සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනතේ 2(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ත්‍රාර්, රාජගුරු බණ්ඩාර රාජගුරු වන මම, මෙහි වූ පළමුවැනි උපලේඛනයෙහි නිශ්චය කොට දක්වා ඇති ("ඒකාබද්ධ වන සමිති" යනුවෙන් හැඳින්වෙන) සමිති මෙහි වූ දෙවැනි උපලේඛනයෙහි නිශ්චය කොට දක්වා ඇති ("ප්‍රධාන සමිතිය" යනුවෙන් හැඳින්වෙන) සමිතිය සමග 1973 අප්‍රේල් 27 වැනි දින සිට ක්‍රියාත්මක වන සේ මෙම ආඥාවෙන් ඒකාබද්ධ කරමි.

රා. බ. රාජගුරු,
සමුපකාර සංවර්ධන කොමසාරිස් හා
සමුපකාර සමිති රෙජිස්ත්‍රාර්.

1973 අප්‍රේල් 03 දින,
කොළඹ 1,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ දීය.

පළමුවෙනි උපලේඛනය

ඒකාබද්ධ වන සමිති :

| | සමිතියේ නම | ලි.ප. අංකය | ලි.ප. කළ දිනය |
|---|---|---|---|
| 1. | සීමාසහිත පොත්තුවිල් කෂිරියා ධීවර සමුපකාර සමිතිය | 1102 | 1942.06.04 |

දෙවෙනි උපලේඛනය

ප්‍රධාන සමිතිය :

| සමිතියේ නම | ලියාපදිංචි අංකය | ලි.ප. කළ දිනය |
|---|---|---|
| සීමාසහිත පොත්තුවිල් ඡන්ද කොට්ඨාශයේ ධීවර කාර්මිකයන්ගේ සමුපකාර සමිතිය | කල් 133 | 1972.02.16 |

4-384/1—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

අංක 439

**1970 අංක 35 දරණ සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත**

2 (1) වැනි වගන්තිය යටතේ ආඥාව

1970 අංක 35 දරණ සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනතේ 2(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්, රාජගුරු බණ්ඩාර රාජගුරු වන මම, මෙහි වූ පළමුවැනි උපලේඛනයෙහි නිශ්චය කොට දක්වා ඇති ("ඒකාබද්ධ වන සමිති" යනුවෙන් හැඳින්වෙන) සමිති මෙහි වූ දෙවැනි උපලේඛනයෙහි නිශ්චය කොට දක්වා ඇති ("ප්‍රධාන සමිතිය" යනුවෙන් හැඳින්වෙන) සමිතිය සමඟ 1973 අප්‍රේල් 27 වැනි දින සිට ක්‍රියාත්මක වන සේ මෙම ආඥාවෙන් ඒකාබද්ධ කරමි.

රා. බ. රාජගුරු,
සමුපකාර සංවර්ධන කොමසාරිස් හා
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්.

1973 අප්‍රේල් 03 දින,
කොළඹ 1,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ දීය.

පළමුවෙනි උපලේඛනය

ඒකාබද්ධ වන සමිති :

| | සමිතියේ නම | ලි.ප. අංකය | ලි.ප. කළ දිනය |
|---|---|---|---|
| 1. | සීමාසහිත කරෙයිතිවු වඩිවේලන් ධීවර සමුපකාර සමිතිය | ඊඩී/289 | 1949.02.02 |
| 2. | සීමාසහිත තිරුතන්ගවේලායුධපුරම් ධීවර සමුපකාර සමිතිය | ඊඩී/290 | 1942.02.02 |
| 3. | සීමාසහිත කරෙයිතිවු මුස්ලිම් ධීවර සමුපකාර සමිතිය | කේඇම/75 | 1963.12.31 |
| 4. | සීමාසහිත කරෙයිතිවු හම්ඩියාකරවාලෙයි ධීවර සමුපකාර සමිතිය | කේඇම/106 | 1967.12.21 |
| 5. | සීමාසහිත කරෙයිතිවු බහාරියාකරවාලෙයි ධීවර සමුපකාර සමිතිය | කේඇම/119 | 1969.10.11 |
| 6. | සීමාසහිත නින්තවූර් දකුණ ධීවර සමුපකාර සමිතිය | ඊඩී/286 | 1949.01.11 |
| 7. | සීමාසහිත නින්තවූර් ජමාලියා කරවාලෙයි ධීවර සමුපකාර සමිතිය | ඊඩී/766 | 1957.02.01 |
| 8. | සීමාසහිත නින්තවූර් අෂාබියා ධීවර කාර්මික සමුපකාර සමිතිය | ඊඩී/844 | 1958.04.10 |
| 9. | සීමාසහිත නින්තවූර් ෆිරුක් ධීවර කාර්මික සමුපකාර සමිතිය | කේඇම/60 | 1961.04.07 |
| 10. | සීමාසහිත ඔලුවිල් ධීවර සමුපකාර සමිතිය | ඊඩී/247 | 1947.11.10 |
| 11. | සීමාසහිත අඩ්ඩාලචේනෙයි හම්ඩියා ණය හා අලෙවි ධීවර කාර්මික සමුපකාර සමිතිය | කේඇම/83 | 1964.10.27 |
| 12. | සීමාසහිත අඩ්ඩාලචේනෙයි සම්සුල්හිතායා ණය හා අලෙවි ධීවර සමුපකාර සමිතිය | කේඇම/90 | 1965.03.05 |
| 13. | සීමාසහිත අඩ්ඩාලචේනේයි පළමුවෙනි කොට්ඨාශයේ ජින්නා ගැඹුරු දිය ණය හා අලෙවි ධීවර සමුපකාර සමිතිය | කල්/129 | 1971.12.15 |

දෙවෙනි උපලේඛනය

ප්‍රධාන සමිතිය :

| සමිතියේ නම | ලි.ප. අංකය | ලි.ප. කළ දිනය |
|---|---|---|
| සීමාසහිත නින්තවූර් ඡන්ද කොට්ඨාශයේ ධීවර කාර්මිකයන්ගේ සමුපකාර සමිතිය | කල් 134 | 1972.02.23 |

4-384/2—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

අංක 438.

**1970 අංක 35 දරණ සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත**

2 (1) වැනි වගන්තිය යටතේ ආඥාව

1970 අංක 35 දරන සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනතේ 2 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්, රාජගුරු බණ්ඩාර රාජගුරු වන මම, මෙහිවූ පළමුවැනි උපලේඛනයෙහි නිශ්චය කොට දක්වා ඇති ("ඒකාබද්ධ වන සමිති" යනුවෙන් හැඳින්වෙන) සමිති මෙහි වූ දෙවැනි උපලේඛනයෙහි නිශ්චය කොට දක්වා ඇති ("ප්‍රධාන සමිතිය" යනුවෙන් හැඳින්වෙන) සමිතිය සමග 1973 අප්‍රේල් 22 වැනි දින සිට ක්‍රියාත්මක වන සේ මෙම ආඥාවෙන් ඒකාබද්ධ කරමි.

රා. බ. රාජගුරු,
සමුපකාර සංවර්ධන කොමසාරිස් හා
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්.

1973 අප්‍රේල් 03 දින,
කොළඹ 1,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ දීය.

පළමුවෙනි උපලේඛනය

ඒකාබද්ධ වන සමිති :

| | සමිතියේ නම | ලි.ප. අංකය | ලි.ප. කළ දිනය |
|---|---|---|---|
| 1. | සීමාසහිත පෙරියකල්ලාර් උතුර ධීවර කාර්මිකයන්ගේ ණය හා අලෙවි සමුපකාර සමිතිය | ඊඩී/452 | 1953.07.04 |
| 2. | සීමාසහිත ඔන්ධච්චිමඩම් ශ්‍රී රාමමූර්ති ධීවර කාර්මිකයින්ගේ සමුපකාර සමිතිය | මඩ/137 | 1972.02.16 |

දෙවෙනි උපලේඛනය

ප්‍රධාන සමිතිය :

| සමිතියේ නම | ලි.ප. අංකය | ලි.ප. කළ දිනය |
|---|---|---|
| සීමාසහිත මාන්මුනෙයි දකුණ ධීවර කාර්මිකයන්ගේ සමුපකාර සමිතිය | මඩ/140 | 1972.02.16 |

4-384/3—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර අලුතෙන් එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අනුමාදව එහි ලැබීමට හැකිවන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවා හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| අප්‍රේල් ... | 73. 04. 06 | සිකුරාද ... | 73. 03. 30 | සිකුරාද | දවල් 12.00 |
| | 73. 04. 11 | බදාද ... | 73. 04. 06 | සිකුරාද | දවල් 12.00 |
| | 73. 04. 19 | බ්‍රහස්පතින්ද... | 73. 04. 11 | බදාද | දවල් 12.00 |
| | 73. 04. 27 | සිකුරාද ... | 73. 04. 19 | බ්‍රහස්පතින්ද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.